## ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008/4 චක්‍ර ලේඛය අනුව ඉඩම් කච්චේරි පවත්වා රජයේ ඉඩම් බෙදා හැර කිරීම සඳහා උපදෙස්.

1. රජය සතු ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමට ඉල්ලුම් පත්‍ර කැඳවීම සඳහා වූ දැන්වීම ප්‍රසිද්ධ කිරීම.

   * ජාතික පුවත්පතක පළාත් ඉඩම් කොමසාරිස් විසින් දැන්වීම ප්‍රසිද්ධ කළ යුතුය.

2. ග්‍රාම නිලධාරී වසම් අනුව ඉල්ලුම්පත්‍ර භාර ගෙන තොරතුරු වල නිරවද්‍යභාවය පරීක්ෂා කිරීමට පරීක්ෂණ පැවැත්වීම.

   * ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකළ යුතුය.

   * මූලික පරීක්ෂණ පැවැත්වීමට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති එක් එක් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ග්‍රාම නිළධාරී විසින් ඉ.කො.105 ආකෘතියට අනුව ප්‍රාදේශීය ලේකම් වෙත තොරතුරු ලබා දිය යුතුය.

   * ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පදිංචි ඉඩම් නොමැති සෑම අයකුටම ඒ සඳහා සහභාගී වීමට ඉඩ ලබා දිය යුතුය.

   * ඉල්ලුම්කරු තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා පුද්ගලිකව පෙනී සිටිය යුතුය.

   * මෙමගින් සැබෑ ඉඩම් නොමැති අය තෝරා ගෙන ලියාපදිංචි කිරීම සඳහා වූ මූලික ලේඛණයට ඇතුලත් කර ගත යුතුය.

   * දැනටමත් අනවසරයෙන් රජයේ ඉඩමක පදිංචි/භුක්ති විඳින අය ද මෙම ලේඛනයට ඇතුලත්ව ලියාපදිංචි වීම අවශ්‍යය.

ලියාපදිංචි කිරීමේ ලේඛනයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලැබූ පුද්ගලයන් ඉ.කො. 157 ලේඛනයට අනුව.

(අ) ඉ.සං.ආ. පනතේ ගොවි පන්තිය යටතේ.

(ආ) ඉ.සං.ආ. පනතේ අඩු ආදායම්, වැඩි ආදායම් හා උගත් තරුණයන් ( ගොවි පන්තියේ නොවන තැනැත්තන් ) යන කාණ්ඩ යටතේ.

(ඇ) ර.ඉ.ආ.පනතේ බදු පදනම මත

(ඈ) ඉ.ප්‍ර.වි.වි. පනත යටතේ

කාණ්ඩවලට වෙන්කර වෙන වෙනම ලියාපදිංචි කර ගත යුතුය.

තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයේ සිට මසක් ඇතුළත මූලික සුදුසුකම් පරීක්ෂා කොට තෝරා ගැනීමේ ලේඛණ පිළියෙල කළ යුතුය.

4. මූලික තෝරා ගැනීමේ ලේඛනය විරෝධතා සඳහා ප්‍රසිද්ධ කිරීම.

ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකළ යුතුය.

විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක කාලයක් ලබා දිය යුතුය.

5. විරෝධතා ලැබී ඇත්නම් ඒවා පරික්ෂා කිරීම සඳහා පරීක්ෂණ පවත්වා අවසන් තෝරා ගැනීමේ ලේඛනය පිළියෙල කර ප්‍රසිද්ධ කල යුතුය.

* විරෝධතා ඉදිරිපත් කිරීමට ලබා දුන් කාලසීමාව අවසන් වන දින සිට දින 14 ක කාලයක් තුල විරෝධතා පරීක්ෂණ අවසන් කර සංශෝධනය කළ යුතු අවස්ථා වේ නම් සංශෝධන සිදුකර අවසන් නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රසිද්ධ කළ යුතුය.

* එම නාම ලේඛනය සහතික කර පළාත් ඉඩම් කොමසාරිස් වෙත හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයකට ඉඩ ලබා නොදේ.

6. සෑම වසරකම නියම කරනු ලබන දිනයකදී නැවතත් ඉහත ක්‍රියාමාර්ගයම අනුගමනය කරමින් ඉඩම් නොමැත්තන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීන කළ යුතුය.

* එහිදී,
  ඉඩම් ලබාදුන් අය
  මියගිය අය
  ප්‍රදේශයෙන් පදිංචිය ඉවත්ව ගිය අය නාම ලේඛනයෙන් ඉවත් කළ යුතු අතර,
  අළුතෙන් ඇතුලත් වන අය ලේඛනයට ඇතුළත් කර ගත යුතුය.

* යාවත්කාලීන කළ ලේඛනයේ පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස් හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.

7. ඉඩම් කච්චේරි යෝජනාව ( සංවර්ධන සැලැස්ම) සකස් කිරීම හා අනුමැතිය ලබා ගැනීම.

* සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී අදාල ආකෘති ( LCD 1, LCD 2, LCD 3 ) භාවිතා කළ යුතුය. [ආකෘති අමුණා ඇත.]

* විශාල ප්‍රමාණයේ ඉඩමක් සඳහා නම් එම ඉඩම ඒකකයක් ලෙස සැලකිය යුතුය.

* ග්‍රාම නිලධාරී වසම/වසම් තුළ තැන තැන විසිරී පවතින කිසි ඉඩම් කොටස් හා අනවසරකරුවන් පදිංචි ඉඩම් බෙදා දීමට තිබෙන ඉඩම් සේ සලකා සංවර්ධන සැලැස්ම පිළියෙළ කළ යුතුය.

* ඉඩම් ඒකකය කුමන ආකාරයේ හෝ රක්ෂිතයකින් මායිම් වන්නේ නම් අදාල රක්ෂිත කොටස් හැර ඉතිරි බිම් කොටස පමණක් බැහැර කිරීමට නිර්දේශ කර සංවර්ධන වාර්තා එවිය යුතුයි.

* තැන් තැන් වල විසිරී පවතින ඉඩම් කැබලි ඉඩම් කච්චේරි මගින් බෙදා දීමට නිර්දේශ සකස් කිරීමේදී අදාල ආකෘතියේ සඳහන් අනුරේඛනය සකස් කිරීමට අවශ්‍ය නොවේ.

* දැනටමත් අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් බැලූ බැල්මට පාරිසරික වශයෙන් අයෝග්‍ය බවට ප්‍රාදේශීය ලේකම් තීරණය නොකරන්නේ නම් එම ඉඩම් සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශ අවශ්‍ය නොවේ. ( LCD 3 සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.)

2

8. සංවර්ධන සැලැස්ම්/ඉඩම් කච්චේරි යෝජනාව අනුමත කිරීමට අදාල ආකෘති පළාත් ඉඩම් කොමසාරිස්/ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.

* පළාත් සභා බල ප්‍ර දේශය තුළ ඉඩම් කච්චේරි යෝජනාව/ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම සඳහා බලතල පැවරී ඇත්තේ පළාත් ඉඩම් කොමසාරිස්ට පමණි.

* අන්තර් පළාත් ගොවි ජනපද බල ප්‍ර දේශ තුළ ඉඩම් කච්චේරි යෝජනාව/ සංවර්ධන සැලැස්ම ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලැබේ.

9. ඉඩම් කච්චේරි පැවැත්වීම

ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා ඉල්ලුම්කරුවන් තෝරා ගත යුත්තේ ඉඩම් නොමැති තැනැත්තන් ලියාපදිංචි ලේඛනයේ නම් සඳහන් අයගෙන් පමණි.

ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා දැන්වීම ප්‍රසිද්ධ කිරීම.

1. ඉ.සං.ආ. පනතේ ගොවි පන්තියේ තැනැත්තන් සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් ප්‍රසිද්ධ කළ යුතුය. ( ඉනි. 88 "අ" )

2. ඉ.සං.ආ. පනතේ ගොවි පන්තියේ නොවන තැනැත්තන් ( අඩු ආදායම් වැඩි ආදායම්, උගත් තරුණයන්) සඳහා පළාත් සභා බල ප්‍රදේශය තුළ පළාත් ඉඩම් කොමසාරිස්ගේ අත්සනින් ප්‍රසිද්ධ කළ යුතුය. ( ඉ.නි. 88 "ආ" )

3. රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු පදනම මත ඉඩම් බෙදා දීමේ දී පළාත් සභා බල ප්‍රදේශය තුළ පළාත් ඉඩම් කොමසාරිස්ගේ අත්සනින් ප්‍රසිද්ධ කළ යුතුය.

* ඉඩම් කච්චේරි පැවැත්වීමේ දී,

ඉ.සං.ආ.පනතේ ගොවි පන්තියේ තැනැත්තන් සඳහා

ඉ.සං.ආ. පනතේ ගොවි පන්තියේ නොවන තැනැත්තන් සඳහා හෝ ( අඩු හෝ වැඩි ආදායම් කාණ්ඩ, උගත් තරුණයන්)

රජයේ ඉඩම් ආඥා පනත යටතේ වෙන වෙනම ඉඩම් කච්චේරි පැවැත්විය යුතුය.

* ඉඩම් කච්චේරි පැවැත්වීමට ප්‍රථමයෙන් කච්චේරිය සඳහා කැඳවන එක් එක් ඉල්ලුම්කරු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ග්‍රාම නිලධාරී විසින් ඉ.කො. 105 ආකෘතිය අනුව තොරතුරු ලබා ගත යුතුය.

* එක් එක් කාණ්ඩ යටතේ ඉඩම් කච්චේරි සඳහා පැමිණෙන තැනැත්තන්ගේ සුදුසුකම් මනාව පරීක්ෂා කර ඉඩම් ලබා දීම සඳහා තෝරා ගත යුතුය. ( සලකා බලන සංරචක සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කර ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය අනුව අවශ්‍යතෙන් ඉඩම් බෙදා දීමේ දී සුදුස්සන් තෝරා ගත හැක.)

* ඉඩම් කච්චේරියේ දී බෙදා දෙනු ලබන උපරිම ඉඩම් සීමාව පළාත් සභා බල ප්‍රදේශ තුළ නම් අදාල පළාත් සභාව මගින් තීරණය කරනු ලැබේ.

දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ

| | | |
|---|---|---|
| පදිංචිය | - | උපරිම පර්: 20 |
| වගාව | - | උපරිම පර්: 80 |

* අනවසරකරුවන් සඳහා මෙම ඉඩම් ප්‍රමාණ ලබා දීමෙන් අනතුරුව ඉතිරි වන ඉඩම් කොටස සඳහා කටයුතු කළ යුතු ආකාරය චක්‍රලේඛයේ 2.1.4 යටතේ දක්වා ඇත.

11. ඉඩම් කච්චේරි පවත්වා තෝරා ගන්නා ලද තැනැත්තන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම.

- ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කල යුතුය.
- එම නාම ලේඛනයේ සඳහන් තේරීම් සම්බන්ධයෙන් මහජනතාවට කිසියම් විරෝධතාවයක් හෝ අභියාචනාවක් ඉදිරිපත් කිරීමට ඇත්නම් එය පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලෙස සටහනක් එම දැන්වීමේ යෙදිය යුතුය.

12. තෝරා ගැනීමේ අවසන් නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම.

* තෝරා ගැනීමේ මූලික නාමලේඛනය ප්‍රසිද්ධ කළ යුතු නියමිත කාල සීමාව අවසන් වීමෙන් අනතුරුව පළාත් ඉඩම් කොමසාරිස් වෙත විරෝධතා/ අභියාචනා කිසිවක් ලැබී තිබේ ද යන්න පිළිබඳ විමසිය යුතුය.

* විරෝධතා හෝ අභියාචනා කිසිවක් නොමැති අවස්ථා වලදී පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීමට අනුමැතිය ලබා දීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රසිද්ධ කිරීම සිදු කළ යුතුය.

  - ඉ.සං.ආ. පනත යටතේ බලපත්‍ර ලබා දීමට 144 ඒ ආකෘති ලබා ගැනීමට පැමිණීමේ දී මෙම අවසන් ලැයිස්තුව ප්‍රසිද්ධ කරන ලද දැන්වීමේ සහතික කරන ලද පිටපතක් හෝ අවසන් ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමට පළාත් ඉඩම් කොමසාරිස් අනුමැතිය ලබා දීමේ ලිපියේ පිටපතක් රැගෙන පැමිණිය යුතුය.
  - රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු මත ඉඩම් ලබා දීමට තෝරාගත් තැනැත්තන් සඳහා බදුකර සැකසීමට නිර්දේශ කිරීමට අදාල වාර්තා එවීමේදී 19 පරිශිෂ්ඨ වාර්තාව හා අතිකුත් ලේඛන සමඟ අවසන් ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමේ දැන්වීමේ සහතික කරන ලද පිටපතක් හෝ අවසන් ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමට පළාත් ඉඩම් කොමසාරිස් අනුමැතිය ලබා දීමේ ලිපියේ පිටපතක් එවිය යුතුය.

* විරෝධතා හෝ අභියාචනා ලැබී ඇති අවස්ථා වලදී ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කොට තීරණය පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත දන්වනු ලැබේ.

පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කිරීම - පළාත් ඉඩම් කොමසාරිස්

↓

මූලික සුදුසුකම් පරීක්ෂණ - ප්‍රා.ලේ/ස.ප්‍රා.ලේ.

↓

සුදුසුකම් ලාභීන්ගේ මූලික
නාමලේඛනය ප්‍රසිද්ධ කිරීම. - ප්‍රා.ලේ.

↓

විරෝධතා පරීක්ෂා කිරීම. - ප්‍රා.ලේ.

↓

අවසාන නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම
හා එහි සහතික කරන ලද පිටපත්
පළාත් ඉඩම් කොමසාරිස් හා ඉඩම්
කොමසාරිස් ජනරාල් වෙත එවීම. - ප්‍රා.ලේ.

↓

සංවර්ධන වාර්තාව සැකසීම - ග්‍රා.නි, ඉ.නි., ප්‍රා.ලේ.

↓

සංවර්ධන වාර්තාව සඳහා අනුමැතිය
ලබා දීම. - ප.ඉ.කො.

↓

කච්චේරි දැන්වීම ප්‍රසිද්ධ
කිරීම. - ඉ.සං.ආ.පනතේ ගොවි පන්තිය
සඳහා - ප්‍රා.ලේ.
ඉ.සං.ආ.පනතේ ගොවි පන්තියේ
නොවන කැනැත්තන් හා ර.ඉ.ආ.
පනත යටතේ - ප.ඉ.කො.

↓

ඉඩම් කච්චේරි පැවැත්වීම
ගොවි පන්තිය, ගොවි පන්තිය නොවන
ර.ඉ.ආ.ප. අනුව වෙන වෙනම) - ප්‍රා.ලේ./ස.ප්‍රා.ලේ./ඉ.නි.

↓

මූලික තෝරා ගැනීමේ ලේඛනය ප්‍රසිද්ධ කිරීම.
පිටපතක් ප.ඉ.කො. හා ඉ.කො.ජ. වෙත එවීම. - ප්‍රා.ලේ.

විරෝධතා/අභියාචනා
ලැබී නොමැති විට

↓

විරෝධතා/අභියාචනා
ලැබී ඇති විට

↓

විරෝධතා /අභියාචනා පරීක්ෂණ පැවැත්වීම
සංශෝධනය කිරීම හෝ නොකිරීම සම්බන්ධ
තීරණ ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දීම. - ප.ඉ.කො.

↓

තෝරා ගැනීමේ අවසන් නාම ලේඛනය ප්‍රසිද්ධ
කිරීමට දැනුම් දීම. - ප.ඉ.කො.

↓

තෝරා ගැනීමේ අවසාන නාම ලේඛනය
ප්‍රසිද්ධ කිරීම. - ප්‍රා.ලේ.